**කාර්යාල ප්‍රයෝජනය සඳහා පමණි.**

තැන්පත් මුදල රු. ...........................................................

ලදුපත් අංකය ...........................................................

...........................................................

ගණකාධිකාරී / ප්‍ර. ක.සේ.නි

<u>**කොළඹ මහා නගර සභාව**</u>

**නාගරික භාණ්ඩාගාරික දෙපාර්තමේන්තුව**

**2022 සහ 2023 වර්ෂයන් තුල කොළඹ මහා නගර සභාවට අයත් පොදු වෙළඳපොළවල හරක් මස් / එළු මස් / ඌරු මස් / කුකුල් මස් විකිණීමේ අයිතිය කුලී පදනම මත ලබාදීම සඳහා ටෙන්ඩර් කැඳවීම.**

---

1. වෙළඳපොළෙහි නම ...........................................................
2. අ). වෙළඳපොලෙහි අංකය ...........................................................

   ආ). වෙළඳාමෙහි ස්වාභාවය ...........................................................
3. ටෙන්ඩර්කරුගේ ටෙන්ඩර් මුදල

   **අ).** ඉලක්කමින් ...........................................................

   **ආ).** අකුරුවලින් ...........................................................
4. ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය ...........................................................
   ...........................................................
5. දුරකථන / ෆැක්ස් අංකය ...........................................................
6. ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින්ද, ලියාපදිංචි කිරීමෙන්ද යන වග ...........................................................
7. ජාතික හැඳුනුම්පතෙහි අංකය ...........................................................
8. **අ)** වයස ........................................ **ආ).** ස්ත්‍රී/පුරුෂ භාවය ...........................................................
9. තැන්පතු කුවිතාන්සියේ අංකය හා දිනය . ...........................................................
10. අ.) ඔබ කිසි කලෙක කොළඹ මහා නගර සභාවේ වෙළඳපොළ වෙළඳකුටි කුලීකරුවෙකු වී සිටිද යන වග
    ...........................................................

    ආ) ඔබ අද දින දක්වා ඔබගේ වෙළඳකුටි බලපත්‍ර ගාස්තුව ගෙවා තිබේද යන වග ...........................................................

    ඇ) ඔබගේ වෙළඳකුටි බලපත්‍ර කිසියම් දිනක අවලංගු කලේ නම් එසේ අවලංගු කිරීමට හේතු.

    ...........................................................

මා මෙම ටෙන්ඩරය ඉදිරිපත් කරනු ලබන්නේ මා වෙනුවෙන් විනා වෙනත් අයෙකුගේ නාමිකයෙකු හෝ නියෝජිතයෙකු වශයෙන් නොවන බව මා මෙයින් ප්‍රකාශ කර සිටිමි. මා විසින් ටෙන්ඩරයේ කොන්දේසි කියවා බලා ඇති අතර ඒවායින් සම්පූර්ණයෙන්ම බැඳීමට මාගේ කැමැත්ත ප්‍රකාශ කර සිටිමි. මා විසින් මෙම ටෙන්ඩරයෙහි ලබා දී ඇති සියලු තොරතුරු සත්‍ය සහ නිවැරදි වන අතර, මා විසින් කිසියම් වැරදි තොරතුරක් ලබා දී තිබුනොත් එය මාගේ ටෙන්ඩරය ප්‍රතික්ෂේප කිරීමට හේතුවන බව මම හොඳාකාරව දනිමි. ටෙන්ඩර් ගාස්තුවට අමතරව VAT ගෙවීමට මම භාර ගනිමි.

දිනය ........................................... ...........................................................

ටෙන්ඩර්කරුගේ අත්සන

සාක්ෂි 1. ........................................................ 2. ........................................................

නම ........................................................ ........................................................

ලිපිනය ........................................................ ........................................................

**<u>කොළඹ මහ නගර සභාව</u>**

**<u>නාගරික භාණ්ඩාගාරික දෙපාර්තමේන්තුව</u>**

**<u>2022 සහ 2023 වර්ෂයන් තුල කොළඹ මහා නගර සභාවට අයත් පොදු වෙළඳපොළ ඇති හිස් හරක් මස් / එළු මස්/ ඌරු මස්/ කුකුල් මස් වෙළඳ සැල් සඳහා ටෙන්ඩර් නියමයන් හා පොදු කොන්දේසි.</u>**

2022 ජනවාරි 01 දිනෙන් ආරම්භ වී වසර 2 ක කාලයක් සඳහා, මේ සමඟ අමුණා ඇති උපලේඛනයෙහි දැක්වෙන හරක් මස්, එළු මස් , ඌරු මස් සහ කුකුල් මස් විකිණීමේ අයිතිය ලබා දීම සඳහා මුද්‍රා තබන ලද ටෙන්ඩර් පිටපත් දෙකකින් යුතුව ටෙන්ඩර් කැඳවනු ලැබේ.

**<u>ටෙන්ඩර්කරුවන්ට පොදු උපදෙස්</u>**

1. ටෙන්ඩර් පෝර්ම කට්ටලයක් වෙනුවෙන් රු. 1000.00 + VAT ගාස්තුව ගෙවීමෙන් අනතුරුව සතියේ දිනවල පෙ.ව 9.00 සිට ප.ව 3.00 දක්වා කොළඹ 07, නගර ශාලාවෙහි නාගරික භාණ්ඩාගාරික දෙපාර්තමේන්තුවෙහි ආදායම් අංශයෙන් ටෙන්ඩර් ආකෘති පත්‍ර සහ ලියවිලි ලබා ගත හැකිය.
2. එක් එක් වෙළඳසැල සඳහා 2022 වර්ෂය සඳහා වන අවම ටෙන්ඩර් මුදල මීට අමුණා ඇති උපලේඛනයෙහි එක් එක් වෙළඳසැල ඉදිරියෙන් දක්වා ඇත.
3. නියමිත අයදුම්පත්‍රය කළු හෝ නිල් කාබන් පෑනක් භාවිතයෙන් පමණක් සම්පූර්ණ කළ යුතු අතර, කිසියම් වෙනස්කමක් කිරීමට අවශ්‍ය වන්නේ නම් අදාල ස්ථානය තනි ඉරකින් කපාහැර, එහි තම කෙටි අත්සන යෙදිය යුතුය.කිසිඳු හේතුවක් මත පැන්සල් හා මකන දියර භාවිතයෙන් වැළකිය යුතුය.
4. පෝරමයෙහි ටෙන්ඩර් මුදල **ඉලක්කමින් සහ අකුරින්** යන දෙයාකාරයෙන්ම ඇතුලත් කල යුතු අතර, එහිදී ඉලක්කම් සහ අකුරු අතර කිසියම් නොගැලපීමක් පැවතියහොත් **අකුරින් සඳහන් කර ඇති මුදල** ටෙන්ඩර් මුදල් ලෙස පිළිගනු ලැබේ.
5. සෑම ටෙන්ඩරයක්ම ටෙන්ඩර්කරු විසින් පෞද්ගලිකව සම්පූර්ණ කර අත්සන් තබා තිබිය යුතුය.
6. සෑම ටෙන්ඩර් අයදුම්පත්‍රයක් ම **<u>මුල් පිටපත සහ අනු පිටපත</u>** වශයෙන් වෙන් වෙන් ව කවර වල දැමීම සිදුකළ යුතු අතර, එම කවර දෙක නැවත එක් කවරයක බහා **නාගරික කොමසාරිස් , කොළඹ මහා නගර සභාව, පුරහල, කොළඹ 07** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ලැබීමට සැලැස්වීම හෝ නාගරික ලේකම් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය හැකිය
7. එකී ලියුම් කවරයෙහි වම් පස ඉහල කෙළෙවරහි ඉල්ලුම් කරනු ලබන **වෙළඳ සැල් අංකය සහ වෙළඳ පොළෙහි නම** පැහැදිලිව සඳහන් කිරීම අනිවාර්යය වන අතර, සෑම ලිපි කවරයකම ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය ද පැහැදිලිව සඳහන් කළ යුතුය.

**<u>ටෙන්ඩර් ආකෘතිපත්‍ර ඉදිරිපත් කිරීම</u>**

1. ටෙන්ඩර් භාරගනු ලබන්නේ උත්පත්තියෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් **ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් පමණි.**
2. ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ජාතික හැඳුනුම්පතෙහි දැක්වෙන සම්පූර්ණ නම සහ වර්තමාන ලිපිනය ඉදිරිපත් කළ යුතුය.
3. ටෙන්ඩර් පෝරම 2021.12.06 දින ප.ව.3.00 දක්වා නිකුත් කරනු ලැබේ.
4. එම නිකුත් කරන ලද අයදුම්පත්‍ර සඳහා අදාල තැන්පතු මුදල 2021.12.07 දින ප.ව 3.00 දක්වා නාගරික

භාණ්ඩාගාරික දෙපාර්තමේන්තුවේ ආදායම් අංශය වෙත ගෙවිය හැකි අතර, මුද්‍රා තැබූ කවරයක බහාලූ ටෙන්ඩර් ලියවිලි 2021.12.08 වන දින පෙ.ව.10.00 ට පෙර නාගරික ලේකම් දෙපාර්තමේන්තුවේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කල යුතුය.

5. ටෙන්ඩර් තැන්පතුව සඳහා ලද කුවිතාන්සියෙහි මුල් පිටපත ටෙන්ඩරයට ඇමිණිය යුතුය.
6. ටෙන්ඩර් අයදුම්පත් පොර්මයෙන් අවශ්‍ය කෙරෙන සියලු තොරතුරු ටෙන්ඩර්කරු විසින් පැහැදිලිව සඳහන් කළ යුතුය.

<u>**ටෙන්ඩර් භාරගැනීම හා විවෘත කිරිම**</u>

1. **2021.12.08 දින පෙ.ව. 10.00 ට ටෙන්ඩර් බාර ගැනීම අවසන් වේ**. ඉන් අනතුරුව වහාම නාගරික ලේකම් දෙපාර්තමේන්තුවේදී ටෙන්ඩර් විවෘත කිරීම සිදු කරනු ලබන අතර ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවට ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයන්ට සහභාගී විය හැකිය.
2. මේ සම්බන්ධව වැඩි විස්තර කොළඹ 07, කොළඹ මහා නගර සභාවේ නාගරික භාණ්ඩාගාරික දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය නාගරික භාණ්ඩාගාරික (ආදායම්) හෝ ගණකාධිකාරී (ආදායම්) වෙතින් ලබා ගත හැකිය.( දු.අංක - 011-2692465 / 011-2699244)

<u>**ටෙන්ඩර් ඇගයීම**</u>

1. එක් එක් වෙළඳසැල සඳහා ටෙන්ඩරය ලබා දෙනු ලබන්නේ ලැබී ඇති ඉහලම ටෙන්ඩර් මිළටය.
2. වෙලඳසැල් හිමියා හෝ නියෝජිත හෝ සේවකයා යනු බලපත්‍ර තබාගෙන ඇති තැනැත්තාය.
3. (අ) සෑම ටෙන්ඩරයක් සඳහා ම අයදුම්පතෙහි අමුණා ඇති උප ලේඛනයෙහි ඇති එක් එක් වෙළඳ සැල ඉදිරියෙහි සඳහන් කර ඇති ටෙන්ඩර් තැන්පත් මුදල, මුදලින් ගෙවා ඊට අදාල ලදුපතේ මුල් පිටපත ඇමිණිය යුතුය. <u>**මේ සම්බන්ධව කිසියම් කඩකිරිමක් සිදුවුවහොත් එය ටෙන්ඩරය ප්‍රතික්ෂේප කිරීමට හේතුවනු ඇත.**</u>

(ආ) වර්ෂයට අදාල වන ටෙන්ඩර් වටිනාකම පෙර වර්ෂයේ දෙසැම්බර් මස 31 දිනට පෙර එක් වාරිකයක් සහ අදාල වර්ෂයේ මාර්තු 31 දිනට එක් වාරිකයක් වශයෙන් <u>**සමාන වාරික දෙකකින්**</u> සම්පූර්ණයෙන් ගෙවා නිමකළ යුතුය. මෙම දිනය (අදාල මාසයේ 31 දින ) නිවාඩු දිනයකට යෙදුනහොත් අවසාන රාජකාරි දින හෝ ඊට ප්‍රථම ගෙවිය යුතුය. අදාල දිනට ගෙවිය යුතු වාරික මුදල් ගෙවීම ට කටයුතු නොකරනු ලබයි නම්, ඊළග මස 01 දින වෙළඳ සැල මුද්‍රා තබනු ලබන අතර, අදාල වෙළඳසැල වෙනුවෙන් රඳවා ඇති ටෙන්ඩර් තැන්පතුව ද ආදායම වෙත බැර කරනු ලැබේ.

(ඇ.) මෙම නිවේදනයෙහි අවශ්‍යතාවයන්ට තරයේම අනුගත වෙමින් ටෙන්ඩර් භාරගැනීම අවසන් වීමට ප්‍රථම වලංගු ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද නමුත් තම ටෙන්ඩරය පිළිගෙන නොමැති සියලු පුද්ගලයින්ට ටෙන්ඩරය සඳහා ලබාදී ඇති තැන්පතුව ආපසු ලබා ගැනීමට හිමිකම ඇත.

(ඈ) මින් පෙර මීට අදාලව කොළඹ මහා නගර සභාව සමග වූ ටෙන්ඩර් ගිවිසුම් උල්ලංඝනය කරන ලද පුද්ගලයන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර, ටෙන්ඩර් කොන්දේසි කඩ කරමින් ඉදිරිපත් කර ඇති ඕනෑම ටෙන්ඩරයක් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4. මෙම ටෙන්ඩරය ඉදිරිපත් කරන්නේ අවංක චේතනාවකින් නොවන බවට එත්තු ගියහොත් හෝ එවැනි ටෙන්ඩරයක් කොළඹ මහා නගර සභාවේ ඕනෑම වෙළඳපොළක හෝ එවැනි ස්ථානයක ලබාදීම සභාවේ මතයට අනුව ටෙන්ඩර්කරුගේ චරිතය හා ක්‍රියා පිළිවෙත් අනුව සුදුසු නොවන බව පෙනී ගියහොත් ඕනෑම ටෙන්ඩරයක් ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය සභාව තබා ගන්නා අතර එවැනි ප්‍රතික්ෂේප කිරිමක් පිළිබඳව හේතු දැක්වීමට සභාව බැඳී නොසිටී.

5. ටෙන්ඩරය සාර්ථක බව දැනුම්දීමෙන් පසු සාර්ථක ටෙන්ඩර් කරුවන් විසින් සති දෙකක් ඇතුලත 2022 වර්ෂයේ මාස 6 ක් සඳහා පිලිගත් ටෙන්ඩර් මුදලින් 50% ක් හා ඊට අදාල වැට් බදු මුදල සති දෙකක් ඇතුලත ගෙවිය යුතුය.

6. මස් වෙළඳසැල් වල ජල හා විදුලි බිල්පත් නොගෙවා හිඟ මුදල් ඇතිවිට ඒවා අයකර ගැනිමට හැකිවන සේ රු. 25,000.00 ක මුදලක් ඇප තැන්පතුවක් ලෙස රඳවා තැබීමට කොළඹ මහා නගර සභාව වෙත ගෙවිය යුතුය.

7. එක් වෙළඳසැලක් සඳහා තැන්පත් කරන ලද ටෙන්ඩර් තැන්පත් මුදල වෙනත් වෙළඳසැලක් සඳහා භාවිතා කල නොහැකි අතර වෙළඳසැලක් සඳහා තැන්පත් කරන ටෙන්ඩර් මුදල අදාල වෙළඳසැල සඳහා පමණක් භාවිතා කළ යුතුවේ.

8. **2023 වර්ෂ සඳහා ගෙවිය යුතු ටෙන්ඩර් ගාස්තුව වන්නේ 2022 වර්ෂයට ගෙවන ලද මුදලට 5% ක වටිනාකම එකතුකිරීමෙන් ලැබෙන මුදලයි.**

9. ඕනෑම ටෙන්ඩරයක් පිළිගැනිමේ හෝ ප්‍රතික්ෂේප කිරිමේ අවසාන තීරණය සභාව සතුවන අතර එයට සියළු කරුණු බැඳී පවතී.

**<u>පොදු කොන්දේසි</u>**

1. ලබාදී ඇති වෙළඳසැල් තුල මස් අලෙවි කිරීම සඳහා කොන්දේසියක් වශයෙන් එක් එක් වෙළඳසැල සඳහා ඝාතක බලපත්‍රයක්, පශු ඝාතක අඥා පනත යටතේ සාර්ථක ටෙන්ඩර්කරු විසින් ලබාගත යුතුය. මෙම බලපත්‍රය එකී වර්ෂයෙහි දෙසැම්බර් 31 දින දක්වා වලංගු වනු ඇත.

2. කොළඹ මහා නගර සභා ඝාතකාගාරයෙහි මරණ ලද හෝ කොළඹ පශු වෛද්‍යවරයා විසින් පරීක්ෂාකර බලා මනුෂ්‍ය පරිභෝජනය සඳහා සුදුසු යැයි තීරණය කරන ලද මස් හැරුනු කොට වෙනත් මස් එකී වෙළඳසැල් වල තැබීම, හෝ විකිණීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය නොකල යුතුය.

3. පොදු වෙළඳපොල පවත්වාගෙන යනු ලබන මස් වෙළඳසැල්හි ඉවතලන මස් අපද්‍රව්‍ය බදුකරු විසින් නිසියාකාරව වෙළඳ පොලෙන් බැහැර කල යුතුය.

4. තමන්ට ලබා දී ඇති වෙළඳපොළවල් වල මස් විකිණීමේදී සභාවේ අතුරු ව්‍යවස්ථා , පශු ඝාතක අඥා පනත පශු රෝග පනත, ආහාර පනත සහ පාරිභෝගිකයන් ආරක්ෂා කිරීමේ පනත යටතේ වන කිසියම් වරදක් සඳහා අධිකරණයන් මගින් වැරදිකරු කර තිබෙනවානම් එවැනි පුද්ගලයෙකු වෙත නිකුත් කර ඇති බලපත්‍ර අවලංගු කරනු ඇත.

5. ඕනෑම ටෙන්ඩර්කරුවෙකු වෙත නිකුත් කර ඇති ඝාතන බලපත්‍රයක් වෙනත් අයෙකුට මාරු කළ නොහැක.

6. (අ) ටෙන්ඩරය සඳහා කලින් කලට අවශ්‍ය වන කොන්දේසි කිසිවක් වෙතොත් ඒවා පැණවීමේ අයිතිය සභාව රඳවා ගන්නා අතර එසේ පනවනු ලබන අමතර කොන්දේසි වලට ටෙන්ඩර්කරු බැඳෙනු ඇත.

(ආ) සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන අවශ්‍යතාවයන්ට සහ කොන්දේසි වලට ටෙන්ඩර්කරු අනුගත විය යුතුය.

7. තමා ටෙන්ඩර් ඉදිරිපත් කරන ස්ථානය පිළිබඳ හා තමා ටෙන්ඩර් කරන වෙළඳපොළෙහි තත්වය පිළිබඳව ටෙන්ඩර්කරුවන්ට අවබෝධයක් තිබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

8. ටෙන්ඩර්කරු විසින් සිය වෙළඳපොළ ටෙන්ඩරය පිළියෙළ කිරිමේදී හෝ එහි ප්‍රතිඵලයක් වශයෙන් ටෙන්ඩර්කරුට දැරීමට සිදුවන කිසිදු වියදමක් සම්බන්ධයෙන් සභාවෙහි වගකීමක් නොමැත.

9. ඉදිරිපත් කර ඇති ටෙන්ඩරයෙහි ඇති කිසියම් තොරතුරක් අසත්‍ය බව පෙනීගියහොත් ටෙන්ඩරය ප්‍රතික්ෂේප කර තැම්පතුව අහිමි කරනු ඇත.

**විශේෂ කරුණු**

1. ටෙන්ඩර් ලියවිලි ඉදිරිපත් කිරීමට බලාපොරොත්තුවෙන් සිට ටෙන්ඩර් තැන්පතුව ගෙවීමෙන් පසු ටෙන්ඩර් ලියවිලි ඉදිරිපත් නොකිරීමට තීරණය කර ඇති හා **2022.12.08** දින පෙරවරු **10.00** ට පෙර ටෙන්ඩර් බාර ගැනීම අවසන් කිරීමට ප්‍රථම ටෙන්ඩර් පෙට්ටියට තැන්පතුව රිසිට් පත ඇතුලු සියළු ටෙන්ඩර් පත් බහා නොමැති ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් තැන්පතුව ආපසු ලබාගැනීමට හිමිකම් ඇත.

නාගරික කොමසාරිස්

කොළඹ මහා නගර සභාව